# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 243/17 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් 17 වැනි දින
කොළඹ දීය.

**නියෝග**

1. මෙම නියෝග හදිසි අවස්ථා (ලංකා ගුවන් විදුලි සංස්ථා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ විධිවිධාන කුමක් වුවද මේ නියෝග ක්‍රියාත්මක විය යුතුය.

3. (1) ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් එකී තත්ත්වයෙන්, 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ යම් බලයක් පාවිච්චි කිරීම, කටයුත්තක් කිරීම හෝ කාර්යයක් ඉටු කිරීම නොකළ යුතු අතර එබඳු සෑම බලයක් පාවිච්චි කිරීම, කටයුත්තක් කිරීම හෝ කාර්යයක් ඉටු කිරීම ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතුය.

(2) 1971 අප්‍රේල් 8 වැනිද සිට මේ නියෝග බල පැවැත්වෙන දිනය දක්වා වූ කාල සීමාව තුළ ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පාවිච්චි කරන ලද බලතල, කරන ලද කටයුතු හා ඉටු කරන ලද කාර්ය සියල්ල එකී සංස්ථාව විසින් පාවිච්චි කරනු ලැබූ ලෙස, කරනු ලැබූ ලෙස හා ඉටු කරනු ලැබූ ලෙසත් 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ වලංගු අයුරින් පාවිච්චි කරනු ලැබූ ලෙස, කරනු ලැබූ ලෙස, හා ඉටු කරනු ලැබූ ලෙසත් සෑම කල්හිම සැලකිය යුතුය.

4. ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යවරයා විසින් කලින් කල ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම නීත්‍යනුකූල වන්නේය.

5. 3 වැනි නියෝගයේ (1) වැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව කියවා තේරුම් ගත යුතු 1966 අංක 37 දරන ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ ස්වකීය බලතල, කටයුතු හෝ කාර්ය සියල්ල හෝ එයින් කිසිවක් ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරා දිය හැකිය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

33A——ඊ 24308—2,100 (76/12)